# විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය සහ එහි වැදගත්කම

ආර්.බී. අමිලා සංජීවනී

විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය යනු අධ්‍යාපනයට අදාළ ඉගෙනුම, ඉගැන්වීම, වටිනාකම්, අගයයන් වැනි මූලික සංකල්ප හා පද තාර්කිකව පැහැදිලි කරමින් ඒවායේ නිවැරදි අර්ථ සහ සීමා හඳුනාගැනීමට යොමු වන දර්ශනමය ප්‍රවේශයකි. මෙය අධ්‍යාපන ක්‍රියාවලියේ අර්ථ, සංකල්පමය ගැටලු, පදනම් දෝෂ අවම කරමින් ප්‍රතිපත්ති සැලසුම්, පාඨමාලා නිර්මාණය, ඉගැන්වීම හා පර්යේෂණ සඳහා විචාරශීලී හා පැහැදිලි මාර්ගෝපදේශයක් ලබා දෙන නිසා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමේදී විශේෂ වැදගත්කමක් දරයි. මෙම ලිපිය දර්ශනය විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය සහ එහි වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරයි.

**දර්ශනය හැඳින්වීම**

දර්ශනය 'Philosophy' යනුවෙන් ඉංග්‍රීසියෙන් හැඳින්වෙන අතර ප්‍රඥාව පිළිබඳ ආදරය යනු මෙහි ග්‍රීක අර්ථය වේ. බටහිර දර්ශනය ගොඩ නැගීම ග්‍රීසිය, රෝමය වැනි රටවල් ආශ්‍රිතව සිදු වී ඇති බවට මෙම ග්‍රීක පදය කදිම සාක්ෂියකි. එසේම දර්ශනය නිර්වචනය කිරීමට අපහසු සංකල්පයකි. වියුක්ත සංකල්පය කි.

ඇරිස්ටෝටල් දක්වන ආකාරයට දර්ශනය යනු සත්‍යය පිළිබඳ අධ්‍යයනය කරන විද්‍යාවයි. ප්‍රඥාව සොයා ගැනීම සහ සිතුවිලි හා ක්‍රියාවට මඟ පෙන්වීම බව ඔස්මන් (2008) සඳහන් කරයි. දර්ශනයෙහි ප්‍රධාන ශාඛා තුනකි. එනම්,

01. අධ්‍යාත්ම විද්‍යාව (Metaphysics) ස්වභාවය කෙබඳුද?

02. ඥානවිභාගය (Epistemology) දැනුමෙහි ස්වභාවය කෙබඳුද? අප දැනුම ඇති කර ගන්නේ කෙසේද?

03. ආචාර විද්‍යාව (Axiology) ජීවිතයේදී අප පිළිපැදිය යුතු සාරධර්ම මොනවාද?

යන්නයි. දර්ශනය විෂය සමාජීය විද්‍යාවකි Neuman (2014) සමාජ විද්‍යාව සමීක්ෂණ, සම්මුඛ සාකච්ඡා සහ සිද්ධි අධ්‍යයන වැනි ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ප්‍රවේශයන් දෙකම භාවිත කරමින් මානව හැසිරීම්, සමාජ සහ අන්තර්ක්‍රියා අධ්‍යයනය කරයි. සමාජීය විද්‍යා වන ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රම, පර්යේෂණ, සම්මුඛ පරීක්ෂණ, නිරීක්ෂණ භාවිත කරයි.

**අධ්‍යාපනික දර්ශනය**

දර්ශනයෙහි ශාඛා රැසක් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පවතින දැනුම පදනම් කරගෙන බිහි වී ඇත. අධ්‍යාපනික දර්ශනය ඉන් එක් ශාඛාවකි. අධ්‍යාපනය යනු ජීවිතය සඳහා ආරම්භයක් නොව, ජීවිතයම වූ ක්‍රියාවලියක් බව ඩිවී (1915) පවසයි. මෙය අධ්‍යාපන දර්ශනයේ මූලික අදහසකි. දර්ශනය අධ්‍යාපනයේ පරමාර්ථ, ස්වභාවය, ක්‍රියාවලිය සහ පරමාදර්ශ පිළිබඳ දාර්ශනික විග්‍රහයක් සපයයි. එම නිසා දර්ශනය සහ අධ්‍යාපනික දර්ශනය අතර අවියෝජනීය සම්බන්ධයක් ඇත. අධ්‍යාපන දර්ශනය මූලික දර්ශනයෙහි ආභාෂය සහිතව විකාශනය වී ඇති අතර මූලික දර්ශන එකක් හෝ කිහිපයක ආභාෂය මේ සඳහා ලැබී ඇත. අධ්‍යාපන දර්ශනය යනු දර්ශනය විෂය ක්ෂේත්‍රයට අදාළ ශාඛාවකි. අධ්‍යාපන දර්ශනය ව්‍යවහාරික දර්ශනයක් වන අතර බෙහෙවින්ම ප්‍රායෝගික වන දර්ශනයකි, ගුණරත්න (2017). අධ්‍යාපන දර්ශන යනු අධ්‍යාපනයේ පරමාර්ථ, ක්‍රියාවලිය, ස්වභාවය සහ පරමාදර්ශ පිළිබඳ දාර්ශනික විග්‍රහයක් යනුවෙන් නිර්වචනය කළ හැකි ය. අධ්‍යාපන දර්ශනය ව්‍යවහාරික දර්ශනයක් වන අතර බෙහෙවින්ම ප්‍රායෝගික වන දර්ශනයකි.

අධ්‍යාපනික දර්ශනය කිසියම් රටක අධ්‍යාපනය සඳහා මාර්ගෝපදේශ මෙන්ම පසුබිම ද සකස් කරන අතර දර්ශනය මගින් අධ්‍යාපනය කෙරෙහි මග පෙන්වීමක් සිදු කරයි. එනම් දර්ශනය සහ අධ්‍යාපනය අතර අවියෝජනීය සම්බන්ධයක් ඇත. අධ්‍යාපන දර්ශනය, දර්ශනය විෂයෙහි ශාඛාවකි. අධ්‍යාපන දර්ශනය සාම්ප්‍රදායික අධ්‍යාපන දර්ශනය සහ විශ්ලේෂීය අධ්‍යාපන දර්ශනය යනුවෙන් දෙවැදෑරුම් වේ.

සේනාධීර (2002) දක්වන ආකාරයට සාම්ප්‍රදායික දර්ශනයේ කාර්යභාරය වූයේ අධ්‍යාපනය හා සම්බන්ධ දර්ශනවාදයන් ගොඩ නැගීමය. මෑත කාලයේදී අධ්‍යාපනයේ විශ්ලේෂණාත්මක දර්ශනය විශ්වීය වැදගත්කමක් ප්‍රකාශ කරමින් සිටී. අධ්‍යාපන ක්‍රියාවලිය විශ්ලේෂණ ක්ෂේත්‍ර තෝරා ගැනීම හේතුවෙන් අධ්‍යාපනික චින්තනයේ විශේෂ වැදගත්කමක් අත්පත් කරගෙන ඇත. ඇතැමෙකු පවසන්නේ දර්ශනයේ මූලික මූල ධර්ම අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා යොදා ගැනීම අධ්‍යාපන දර්ශනය බවයි (කීර්තිරත්න, 2021).

අධ්‍යාපන දර්ශනය සම්බන්ධයෙන් විද්වතුන්ගේ ඒකමතික අදහසක් නොමැති අතර ඇතැම් දාර්ශනිකයන් පවසන්නේ අධ්‍යාපන දර්ශනයට පිළිගත හැකි විෂය ක්ෂේත්‍රයක් නොමැති බවත්ය. එය අධ්‍යාපනයේ ඇති ප්‍රශ්නවලට සාමාන්‍ය දර්ශනයේ ඇති කරුණු ඇදා ගැනීමක් බව ආර්.එස්. පීටර්ස්ගේ අදහසයි.

අබේපාල (2019) දක්වන ආකාරයට අධ්‍යාපන දර්ශනයට සම්බන්ධිත අනෙකුත් මාතෘකාවන් වනුයේ දැනුම හෙවත් ඥානය, දැනුම අත් කරගන්නා මනසේ ස්වභාවය සහ මානව ජීවය, බලාධිකාරයේ ගැටලු, අධ්‍යාපනය හා සමාජය අතර පවත්නා අන්තර් සම්බන්ධතාව යනාදියයි. කෙසේ වුවද අධ්‍යාපනය සහ දර්ශනය අතර පවතින සබඳතාවය හේතු කොටගෙන ලොව පුරා සේවාස්ථ සහ පූර්ව සේවා ගුරු අධ්‍යාපන පාඨමාලාවල අනිවාර්යය විෂයයක් ලෙස අධ්‍යාපන දර්ශනය හඳුනාගත හැකිය.

**විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය**

විශ්ලේෂණාත්මක දර්ශනය 19 වන සියවසේ අවසාන දශකයේ සිට වර්තමානය දක්වා වර්ධනය වී ඇති දාර්ශනික විමසීම් සහ මූලධර්මවල යම් පරාසයකට යොමු වේ. විශ්ලේෂණාත්මක දර්ශනය යනු භාෂා විශ්ලේෂණය, තර්කමය නිර්මාණය සහ සංකල්ප මත පදනම් වූ දාර්ශනික ප්‍රවණතාවයකි (Ayer, 1936). මෙම දාර්ශනිකයින් බොහෝ දෙනෙක් බ්‍රිතාන්‍ය සහ ඇමරිකානු දාර්ශනික පරිසරයන්ට අයත් වන නමුත්, ආරම්භකයින් අතර කැපී පෙනෙන විෂමතා පවතී. ගොට්ලොබ් ෆ්‍රෙජ් ජර්මානු ජාතිකයෙකු වූ අතර විට්ගන්ස්ටයින් ඔස්ට්‍රියානු ජාතිකයෙකි. විශ්ලේෂණාත්මක දාර්ශනික විලාසය විවිධ

රටවලට ව්‍යාප්ත වී ඇත. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් අනුභූතික සම්ප්‍රදාය සමග සම්බන්ධ වී ඇති අතර, නිසැකවම සත්‍ය ලෙස දන්නා එකම ප්‍රස්තුත විශ්ලේෂණාත්මක ඒවා යන අදහසට කැපවී සිටිති. දර්ශනය විශ්ලේෂණාත්මක ක්‍රියාකාරකමක් ලෙස සලකති. දාර්ශනික ගැටලු විසඳීමට හෝ විසඳීමට අවශ්‍ය ලෙස භාෂා අධ්‍යයනය අපේක්ෂා කරති.

නූතන දර්ශනය බොහෝ විට මිනිසා සහ ලෝකය සහ මෙම අදහස්වල ඉතිහාසය පිළිබඳ අදහස් ගොඩනැගීම ලෙස ඉදිරිපත් කර ඇත (Popper, 1934). විද්‍යාත්මක දැනුම හා දාර්ශනික විශ්ලේෂණය අතර සම්බන්ධය පැහැදිලි කරයි. විද්‍යාත්මක න්‍යායන්ගේ තර්කමය මූලධර්ම විශ්ලේෂණය, විද්‍යාත්මක මූලධර්ම වල නිවැරදිභාවය සහ යුක්තිය විශ්ලේෂණය කිරීම සිදු කරයි.

මේ අනුව, ඔවුන් පැහැදිලිකම සෙවීමේ සහ ප්‍රවේශමෙන් තර්ක කිරීමේ නිරත වී ඇත. ඔවුන් බොහෝ විට පාරදෘෂ්‍ය විද්‍යාත්මක ගැටලු කෙරෙහි අවධානය යොමු කර ඇති අතර භාෂාව අධ්‍යයනය කිරීම සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් පවරා ඇත. විසිවන සියවසේ විශ්ලේෂණාත්මක දර්ශනයේ ප්‍රධාන කතුවරුන් සහ ගැටලු පිළිබඳ දළ විශ්ලේෂණයක්, වර්තමාන දාර්ශනික විවාදවලට අනුව Soames (2003) විසින් සපයනු ලැබේ.

ප්ලේටෝ, රූසෝ, ඩුවී ආදීන් ඉදිරිපත් කළ ස්වභාව වාදය, විඥාන වාදය, උපයෝගීතා වාදය, පැවතුම් වාදය හා යථාර්ථවාදය ආදිය සාම්ප්‍රදායික අධ්‍යාපන දර්ශනයට අයත්වේ. සාම්ප්‍රදායික අධ්‍යාපන දර්ශනවල සමහර මූලධර්ම පන්ති කාමර ක්‍රියාවලියයේදී ගුරුවරයාට මුහුණ දීමට සිදුවන ගැටලුවලට වැඩි අදාළත්වයක් නොමැත යන්න හර්ට්ස් (1892) සඳහන් කරන අතර පැරණි, එමෙන්ම සාම්ප්‍රදායික වූද අධ්‍යාපන දර්ශනයට විකල්පයක් ලෙස විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය ආරම්භ වී ඇත. 1960 දශකයේ සිට මෙම දර්ශනය පිළිබඳ නැඹුරුවක් ඇති විය

විශ්ලේෂණාත්මක අධ්‍යාපන දාර්ශනිකයන් අධ්‍යාපන සංකල්ප විග්‍රහය සහ තර්කපූර්ණ විශ්ලේෂණය මගින් අධ්‍යාපනයේ අරමුණු, අගයන් සහ දැනුම් ව්‍යුහය පැහැදිලි කරන Russell (1926) විසින්

Education and the Good Life ග්‍රන්ථය තුළ ජීවිතයේ සුභසාධනය අධ්‍යාපනයේ අරමුණ ලෙස නිරූපණය කරයි. Wittgenstein (1953) විසින් Philosophical Investigations මගින් භාෂා විශ්ලේෂණය අධ්‍යාපන සංකල්ප අවබෝධයට අදාළ කරයි. Peters (1966) ගේ Ethics and Education අධ්‍යාපනයේ නීතිමය හා අගයමය මූලධර්ම පැහැදිලි කරයි. Hirst (1974) විසින් Knowledge and the Curriculum කෘතිය තුළ දැනුමේ ස්වභාවය විග්‍රහ කරයි. Israel & Scheffler (1960) ගේ The Language of Education කෘතියේ අධ්‍යාපන භාෂාවේ නිවැරදි අර්ථකථනය විග්‍රහ කරයි.

මෙම දර්ශනය විසිවන ශතවර්ෂයේ පහළ වූ දාර්ශනිකයින් අතින් බිහි වූවක් යන්න විශ්වාස කළද සොක්‍රටීස් සංවාද ක්‍රමය මගින් සංකල්ප විශ්ලේෂණය කිරීමට උත්සාහ කළ බවක් ද හඳුනාගත හැකිය (සේනාධීර සහ වනසිංහ, 2002). විශ්ලේෂණය යන්න තර්කනය (Logic), තාර්කික (Rational), විනිශ්චය (Diagnostic) සහ ක්‍රමානුකූල (Systematic) යන පදවලින්ද අර්ථ ගැන්වේ. ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (1992) දැක්වෙන ආකාරයට සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපක හැකියාව, ආරම්භක ශක්තිය, විචාර ශීලී චින්තනය, වගකීම් හා වගවීම, ඇතුලු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම, පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලාංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම, ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස් කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම වැනි අරමුණු කෙරෙහි ළඟා වීමට විශ්ලේෂණාත්මක අධ්‍යාපනය ඉතා ඉහල කාර්යභාරයක් සිදු කරයි.

බෙන්ජමින් බ්ලූම්ගේ වර්ගීකරණය දැනුමේ ක්ෂේත්‍ර හයක් පිළිබඳ සාකච්ඡා කරයි. එනම් දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණය, සංස්ලේෂණය, ඇගයීම වේ. විශ්ලේෂණය, සංස්ලේෂණය, ඇගයීම ඉහල ප්‍රජානනය නියෝජනය කරන අතර දැනුම, අවබෝධය, භාවිතය පහළ ප්‍රජානනය ලෙස හඳුනාගත හැකිය. "විශ්ලේෂණය කිරීම

යනු සංකල්පයක්, සංසිද්ධියක් හෝ දත්ත කට්ටලයක් ක්‍රමානුකූලව විච්ඡේදනය කිරීම, ප්‍රධාන සංරචක සහ ඒවායේ අන්තර් ක්‍රියා හඳුනා ගැනීමයි'' (හියුබර්මන්, 1994). ගුරුවරයා ස්වකීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඉහළ ප්‍රජානනය ඇති වන ආකාරයට සැලසුම් කිරීම, සංවිධානය, මෙහෙයවීම සහ පාලනය කළ යුතුය. දැනුම, අවබෝධය, භාවිතය බ්ලූම් ගේ වර්ගීකරණය තුළ පහළ මට්ටමේ කුසලතා යනුවෙන් හැඳින්වේ. සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රියාවලිය තුළ අවධානය යොමු කරනුයේ ද පහල මට්ටමේ කුසලතා කෙරෙහි ය (ලේකම්ගේ, 2010). උසස් චින්තන කුසලතා Higher Order Thinking Skills (HOTS) අධ්‍යාපනය සඳහා අත්‍යවශ්‍ය වන්නේ ඒවා සිසුන්ට කටපාඩම් කිරීමෙන් ඔබ්බට ගොස් විවේචනාත්මක, විශ්ලේෂණාත්මක සහ නිර්මාණාත්මක ගැටලු විසඳීමේ හැකියාවන් වර්ධනය කිරීමට උපකාරී වන බැවිනි. විශ්ලේෂණය, ඇගයීම සහ නිර්මාණය වැනි මෙම කුසලතා, සැබෑ ලෝක තත්වයන් තුළ දැනුම යෙදීමට, ස්වාධීනව සිතීමට සහ දැනුවත් තීරණ ගැනීමට සිසුන්ගේ හැකියාව වැඩි දියුණු කිරීමට වැදගත් වේ. HOTS සංවර්ධනය කිරීමෙන්, ඉගෙනුම් ලාභීන් සංකීර්ණ අභියෝග සඳහා සූදානම් කරවයි, ඔවුන්ගේ අනුවර්තනය වීමේ හැකියාව වැඩි දියුණු කරයි, සහ ජීවිත කාලය පුරාම ඉගෙනීම දිරිමත් කරයි.

**විශ්ලේෂී අධ්‍යාපන දර්ශනයේ මූලික කරුණු.**

1. අධ්‍යාපනික දර්ශනය යන්නෙන් නිශ්චිත වශයෙන් කුමක් අදහස් කෙරේද?
2. අධ්‍යාපන දර්ශනය ගොඩ නැගීම කොතෙක් දුරට මනෝවිද්‍යාත්මක, ඥාන විමංසීය සහ ආචාර ප්‍රපංචයක් පදනම් කර ඇත්ද?
3. අධ්‍යාපනික දර්ශනයක් තුළින් අපට ලබාගත හැකි අධ්‍යාපනික ක්‍රමවේදයන් කවරේද?
4. බුද්ධිමය ක්‍රියාවලීන් සහ පුරුදු ආශ්‍රිත ක්‍රියාවලීන් ආශ්‍රිත ක්‍රියාවන් අතර අසමානතාවයක් දෘෂ්‍යමාන වේද?
5. ආධ්‍යාපනික ක්‍රියාවලීන් තුළින් ලබා ගන්නා විවිධ දැනුම් වර්ගවල සමානකම් හා වෙනස් කම් දෘෂ්‍යමාන වේද?

6. සදාචාරය ඉගැන්විය හැකිද?

7. පුද්ගලයෙකුට තමන්ට යහපතක් යයි උගන්වනු ලැබූ ගුණධර්මවලට විරුද්ධ වීමේ හැකියාවක් තිබේද? යනුවෙන් (Chain, 1970) අදහස් දක්වා ඇත. වර්තමාන අධ්‍යාපන පද්ධතියට එල්ල වන ප්‍රධානම චෝදනාවක් වනුයේ එය බොහෝ දුරට ශිෂ්‍යයන් ක්‍රියාකාරී කිරීම වෙනුවට, වියුක්ත චින්තනය ඇති කිරීම වෙනුවට සාම්ප්‍රදායික තොරතුරු ගබඩා කිරීමකට පරිවර්තනය වී ඇති ස්වභාවයක් ගන්නා බවයි.

විශ්ලේෂී අධ්‍යාපන දර්ශනයට අදාළ කරුණු පළමු ගණයේ අධ්‍යාපනික දාර්ශනිකයින් විසින් සැලකිල්ලට භාජනය කර ඇත (සේනාධීර සහ වනසිංහ, 2002). අධ්‍යාපනය සමාජ ව්‍යුහයක කොටසක් ලෙස දැක්වන අතර විශ්ලේෂී දර්ශනයෙහි පදනමක් ලෙස, අධ්‍යාපනය සමාජය තුළ බලය සහ සම්පත් බෙදා හැරීමේ මෙවලමක් වශයෙන් ද විග්‍රහ කෙරේ. එසේම මෙහිදි ශිෂ්‍යයාට දැනුම පිළිබඳව ප්‍රශ්න කිරීමට, විවේචනය කිරීමට, සහ සමාජය පරිවර්තනය කිරීමට අවශ්‍ය හැකියාවන් ලබාදීම අරමුණු කරයි. අධ්‍යාපනය සමාජ පරිවර්තනය කිරීම සඳහා භාවිත කළ යුතු මෙවලමක් ලෙස සලකයි. ජාතික අධ්‍යාපන කොමිෂවන් සභා වාර්තාව (2003) අනුව එක් වූ නවතම නිපුණතාව වන වැඩ ලෝකයට අවශ්‍ය නිපුණතා ව මගින් ආර්ථික සංවර්ධනය ට දායක වීම, තම වෘත්තීය ලැදියා සහ අභියෝග හඳුනා ගැනීමට, හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම සිදු කරන අතර ඊට අවශ්‍ය දැනුම ආකල්ප කුසලතා මෙන්ම උපකරණ භාවිතය, අනුයෝගී උපකරණ නිර්මාණය කිරීමේ හැකියාව දරුවාට ලැබේ. මේ සඳහා විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය මනා පසුබිමක් සපයයි.

ගුරුවරයා ආදේශාත්මක පුහුණුකරු නොව, විශේෂයෙන් සාකච්ඡා සහ විවේචනයක් ඇති කරන සාමාජිකයෙකු වශයෙන් භාවිත වේ. වර්තමානය වන විට ගුරු භූමිකාව සුසාධ්‍යකාරකයෙකු යන්න කෙරෙහි වෙනසකට ලක් වී ඇත.

**අධ්‍යාපනයේ විශ්ලේෂණාත්මක දර්ශනය**

අධ්‍යාපන න්‍යාය තුළ ශක්තිමත් ජාත්‍යන්තර පැවැත්මක් රඳවා ගනී (Penny, 2023).

විශ්ලේෂී අධ්‍යාපන දර්ශනයේ මූලික ලක්ෂණ සේනාධීර, වනසිංහ (2018) දක්වන ආකාරයට

1. භාෂාමය සහ සංකල්පමය විශ්ලේෂණයක් වීම
2. විමර්ශනාත්මක විනිශ්චිත භාවය
3. තියුණු අන්දමට සංකල්ප විග්‍රහ කිරීම
4. සංකල්ප වල සීමාවන් නිශ්චිත කිරීම දැක්විය හැක

විශ්ලේෂී අධ්‍යාපන දර්ශනයේ මූලික ලක්ෂණ සේනාධීර සහ වනසිංහ (2018) අනුව පහත පරිදි පැහැදිලි කළ හැකිය. විශ්ලේෂණය සිදු කරන විට භාවිත වන භාෂාව, පද සහ සංකල්ප පිළිබඳ ගැඹුරු අවබෝධයක් අවශ්‍ය වෙයි. එකම පදයකට විවිධ තේරුම් තිබිය හැකි බැවින්, ඒවා විවරණය කිරීම, අර්ථ සෙවීම සහ භාවිත සෙවීම වැදගත් වේ. ඉංග්‍රීසි, සිංහල දෙමළ වැනි ද්විතියික භාෂාවක් සංවර්ධනය කිරීමේ දීත්, කොරියානු භාෂාව, අරාබි, ජපන් වැනි වැඩ ලෝකයට අත්‍යවශ්‍ය භාෂාවකට අදාළ ප්‍රවීණතාව ලැබීමට, මෙන්ම කලා විෂය ධාරාව යටතේ භාෂා අධ්‍යයනය සඳහා ඉහත සේනාධීර සහ වනසිංහ දක්වන ආකාරයට භාෂා සංවර්ධන කිරීමටත්, ප්‍රාථමික අවධියේදී දරුවාගේ භාෂා සංවර්ධනය සඳහාත් වැදගත් වේ.

විද්‍යාව, ගණිතය ශුද්ධ විද්‍යාවන් යටතට ගැනෙන අතර විද්‍යාත්මක විමර්ශන ක්‍රියාවලිය මෙම විද්‍යාවන්ගේ පදනම් වෙයි. මෙරට පොදු ජාතික අරමුණු අතර සාකච්ඡාවට ගැනෙන මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතා ව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම් සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකික අනන්‍යතාවය තහවුරු කිරීම ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (1992) මගින් සිසුන් අනම්‍ය වූ බෙදීම් ආදිය වෙනුවට සෑම අදහසක්ම

පිළිගැනීමක් නොවී විද්‍යාත්මක විමර්ශනයට ලක්කිරීම, සාධක සහ සාකච්ඡාව මත විනිශ්චය කිරීම මෙහිදී සිදුවේ. අධ්‍යාපනය අදහස්, න්‍යාය හා සංකල්ප අභියෝගයට ලක් කරමින්, තාර්කික විග්‍රහයක් සිදු කිරීම මෙයට අයත්ය.

එනම් විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය යනු සාමාන්‍ය අදහස්වලට අභියෝග කළ හැකි, ගැඹුරු විමර්ශන මගින් සත්‍යය, අර්ථය සහ අධිපත්‍යය විමසා බැලිය හැක්කකි. සාම්ප්‍රදායික සමාජීය විද්‍යාවන් හැදෑරීම වෙනුවට වැඩ ලෝකයට අදාළ කුසලතා අත්පත් කර දීමට හැකි විෂයයක් හැදෑරීමට අවකාශ විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය පදනම් කර ගැනීම මගින් සිසුන්ට ලබා දිය හැකි ය. ජාතික අධ්‍යාපන කොමිසම (2003) හඳුන්වා දුන් නිපුණතා වන වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතාව සහ පෞරුෂ සංවර්ධනයට අවශ්‍ය නිපුණතා ව අත්පත් කර ගැනීමට මෙම විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය විෂයමාලාවට මනා පිටුවහලක් සපයයි. කාලීනව නිර්මාණය වන නව අධ්‍යාපන සංකල්ප ඇතුළත් කිරීමට, විශ්ලේෂණය කිරීමට විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය ඔස්සේ අවකාශ සැලසේ. ක්වොන්ටම් යාන්ත්‍ර විද්‍යාව, කෘතිම බුද්ධිය "STEAM, STEM, MOOCS" වැනි නූතන විද්‍යාත්මක සංකල්ප ජනනය කිරීමට විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය ඔස්සේ හැකියාව ලැබී ඇත.

බහු සංස්කෘතික සමාජයක ජීවත්වීමට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා සහිත පුරුද්දක් නැතහොත් නිපුණතා අත්පත් කර දීමට බහු සංස්කෘතික අධ්‍යාපනය, වර්තමානය පිළිබඳ අවදියෙන් කටයුතු කිරීමට අදාළ සතිමත් බව, ආදිය මගින් අධ්‍යාපනයට නව සංකල්ප එකතු කිරීමට විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය මගින් හැකියාව ලැබී ඇත. එසේම සංකල්පවල සීමාවන් පැහැදිලිව විමර්ශනය කිරීමට මෙමගින් හැකියාව ලැබී ඇත. අධ්‍යාපන පරමාර්ථ, අරමුණු, සුවිශේෂී අරමුණු ආදී වශයෙන් සංකල්ප සුවිශේෂී කිරීමට ඒවා අතර සීමාවන් පැනවීමට වැදගත්ය.

ඒ අනුව විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය මගින්

1. සංකල්ප ගැඹුරින් විශ්ලේෂණය

2. නව අධ්‍යාපන සංකල්ප ජනනය කිරීම
3. සංකල්පවල සීමාවන් දැක්වීම සිදු කරන බව සේනාධීර සහ වනසිංහ (2018 ) දක්වයි.

එසේම අධ්‍යාපන ආයතන සහ සමාජය අතර ඇති සම්බන්ධය තහවුරු කිරීමට අවකාශ සපයයි.

විශ්ලේෂීය අධ්‍යාපනය දර්ශනය තුළ වැදගත් වන කරුණු රාශියක්ම විද්‍යාවේ සහ ආචාර ධර්මවල දර්ශනයන්ටද අදාළ වේ සේනාධීර, වනසිංහ (2002). නිරීක්ෂණය, එම නිරීක්ෂණයට අදාළ ගැටලුව හඳුනා ගැනීම, ගැටලුවට අදාළව කල්පිත ගොඩ නැගීම, කල්පිත පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ සැලසුම් කිරීම, දත්ත රැස්කිරීම, දත්ත විශ්ලේෂණය, නිගමනයට එළඹීම යන විද්‍යාත්මක විමර්ශන ක්‍රියාවලිය ඔස්සේ දර්ශනය හැසිරවීමට උත්සාහ ගැනීමකි. මේ අනුව විශ්ලේෂී අධ්‍යාපන දර්ශනයට විද්‍යාත්මක ස්වරූපයක් ඇති අතරම විකල්ප, ගැඹුරු විශ්ලේෂණ ස්වභාවයක් මෙම විෂය ක්ෂේත්‍රය අත්පත් කර ගෙන ඇත. සාම්ප්‍රදායික දර්ශනය කරුණු විශ්ලේෂණය නොකරන අතර සංකේතාත්මක තර්කනය වැනි ක්‍රම විධි භාවිත කරයි. මෙම විෂය සාම්ප්‍රදායික දර්ශනය මෙන් න්‍යායාත්මක පද්ධතියක් ගොඩ නැගීම වෙනුවට සංකල්ප භාෂාව සහ තර්කනය මගින් විශ්ලේෂණය කිරීමට උත්සාහ කරයි. එසේම විශ්ලේෂී අධ්‍යාපන දර්ශනයේ දී විවිධ අධ්‍යාපනික සංකල්ප ගැඹුරින් විග්‍රහ කිරීම සිදු වේ. මෙහිදී සංකල්ප විශ්ලේෂණය පමණක් නොව භාෂාමය විශ්ලේෂණයක්ද සිදු වේ (සේනාධීර සහ වනසිංහ, 2018).

සමාජය පිළිබඳ විචාරාත්මක අවබෝධය ලබාදීම විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය මගින් සිදුකළ හැකිය. විශ්ලේෂී දර්ශනය අධ්‍යාපන ක්‍රියාවලියේදී සිසුන්ට සමාජයේ අසාධාරණතා, විෂමතා සහ බලය විමසා බලන හැකියාව ලබාදෙයි. මානව ප්‍රගමනය අඩාල කරවන ජනවිඥාන ගතව පවතින විවිධ දුර්මත ඉවත් කිරීමටත්, ඒවායේ බලපෑම අවම කිරීමටත් විශ්ලේෂී දර්ශනය වැදගත් වේ. විශ්ලේෂණය, ඇගයීම සහ නිර්මාණය වැනි මෙම කුසලතා සැබෑ ලෝක තත්වයන් තුළ දැනුම යෙදීමට, ස්වාධීනව සිතීමට සහ දැනුවත් තීරණ ගැනීමට සිසුන්ගේ හැකියාව වැඩි දියුණු කිරීමට වැදගත් වේ. ලේකම්ගේට

(2010) අනුව ඉහල ප්‍රජානන හැකියාව HOTS සංවර්ධනය කිරීමෙන්, ඉගෙනුම්ලාභීන් සංකීර්ණ අභියෝග සඳහා සූදානම් කරවයි, ඔවුන්ගේ අනුවර්තනය වීමේ හැකියාව වැඩි දියුණු කරයි, සහ ජීවිත කාලය පුරාම ඉගෙනීම දිරිමත් කරයි. 6-11 ශ්‍රේණි වල විද්‍යාව විෂයමාලාවේ අභිමතාර්ථයක් වන විද්‍යාවේ ගතික ස්වභාවය සහ සීමා හඳුනාගෙන එදිනෙදා ජීවිතයේ අත්විඳින සහ විවිධ මාධ්‍ය ඔස්සේ ලැබෙන තොරතුරු විද්‍යාත්මක නිර්ණායක අනුව ඇගයීමේ කුසලතා අත්පත් කර ගනී (ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, 2018). එසේම විෂමතා හෙළිදරව් කිරීම මෙමගින් සිදු කෙරේ. සමාජය තුළ පදනම් විරහිතව ගොඩ නැගී ඇති විවිධ ස්ථර ප්‍රතික්ෂේප කිරීමට මෙම විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය වැදගත් වේ. අධ්‍යාපනය තුළ වෙන් කිරීම් පුම්තිරි බව, ජන වර්ගය, සමාජ පන්තිය (Gender, Race, Class) කෙරෙහි අවධානය යොමු කරමින් එම විෂමතා සම්මත වශයෙන් පිළිගැනීමක් නොව, විවේචනීයව විග්‍රහ කිරීමක් සිදු වේ.

චින්තන දැක්ම වර්ධනය කිරීම විශ්ලේෂණාත්මක අධ්‍යාපනය සිසුන්ට පිළිගත් අදහස් අභියෝගයට ලක් කිරීම සහ තමාගේ අදහස් ස්වයං වින්‍යාසයෙන් සාධනය කිරීමේ හැකියාව වර්ධනය කරයි. අතීතයේදී සත්‍ය ලෙස පිළිගත් ජෝන් ඩෝල්ටන්ගේ පරමාණුක වාදය, ජෛව පරිණාමය පිළිබඳ විවිධ වාදයන්, විවිධ ආකෘති පිළිබඳ දැනුවත් බව ආදිය වර්තමානය වන විට යම් යම් සංශෝධනයන්ට ලක්ව ඇති අතරම ඇතැම් අංග නවීන විද්‍යාවේ සොයා ගැනීම් සමග ප්‍රතික්ෂේප වී ඇත. විචාරාත්මක චින්තන දැක්ම තුළින් නව අනාවරණ සිදු කිරීමට විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය මත සිට සිදු කරන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් සිදුකළ හැකිය (ලේකම්ගේ, 2010). උසස් චින්තන කුසලතා HOTS අධ්‍යාපනය සඳහා අත්‍යවශ්‍ය වන්නේ ඒවා සිසුන්ට කටපාඩම් කිරීමෙන් ඔබ්බට ගොස් විවේචනාත්මක, විශ්ලේෂණාත්මක සහ නිර්මාණාත්මක ගැටලු විසඳීමේ හැකියාවන් වර්ධනය කිරීමට උපකාරී වන බැවිනි. අධ්‍යාපනයේ සීමාවන් අවබෝධ කිරීම මගින් සම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමවේදයන් තුළ පවතින සීමා, පක්ෂපාතිත්වය සහ බලය බෙදා හැරීම පිළිබඳ අවධානය යොමු කරවන බව ලේකම්ගේ ඇතුළු පිරිස (2007) දී පෙන්වා දී ඇත. Kandy (1991) Lepani & Michel (1995) දක්වන ආකාරයට ඉහළ ප්‍රජානන කුසලතා මෙසේ වර්ග කර දක්වයි.

1. ගැටලුව අවස්ථාවලදී තර්කානුකූලව තීරණ ගැනීම
2. වෙනස්කම්වලට හැඩ ගැසීම
3. විවේචනාත්මක චින්තනය හා තර්කනය
4. කණ්ඩායම තුළ ඵලදායී ලෙස කටයුතු කිරීම
5. ස්වාධීනව ඉගෙනුම
6. බහුවිධ පර්යාය ලෝකවලින් දැකීම
7. ගැටලු විසඳීමට

මේ අනුව විශ්ලේෂී අධ්‍යාපනය පුද්ගලයන්ට ඍජු සහ සක්‍රීය පුරවැසියන් වශයෙන් ක්‍රියා කිරීමට උපකාරී වේ.

විශ්ලේෂණාත්මක ඉගෙනීම විශ්ලේෂණය තුළින් ශිෂ්‍යයා ඉගෙනුමට පුරුදු පුහුණු කරයි. විශ්ලේෂණය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භාවිත කිරීම ඉතාම ඈත අතීතයේ සිටම භාවිතයට ගැනුණු බවට සාක්ෂි හමු වේ. බෞද්ධ ඉගැන්වීම්වලදී විශ්ලේෂණාත්මක චින්තනය සහ විවේචනාත්මක විමර්ශනය දැඩි ලෙස අවධාරණය කර ඇති බව පැහැදිලි ය. විශ්වාසයන් අන්ධ ලෙස පිළිගැනීමට වඩා, තර්කනය සහ ඍජු අත්දැකීම් තුළින් තමන් විසින්ම පරීක්ෂා කර අනාවරණය කරගෙන තේරුම් ගැනීමට බුදුන් වහන්සේ තම අනුගාමිකයන් දිරිමත් කළහ.

ජාතික අධ්‍යාපන කොමිසම සඳහන් කරන ආකාරයට වර්තමාන පන්ති කාමරය විශේෂ අවධානය අවශ්‍ය වන ශෝචනීය ස්ථානයක් ලෙස හඳුනා ගෙන ඇත. පන්ති කාමරය ඒකාකාර වාතාවරණයකින් හෙබි මුළු කාලයෙන් 70කට වඩා නීරස කතාවෙන් ගත කරන ගුරුවරයා බහුල වශයෙන් පෙළ පොත කෙරෙහි පමණක් අවධානය යොමු කරන ඉගෙනුම් කාර්යයෙහි ලා සිසුන්ගේ සහභාගීත්වය ප්‍රමාණවත් නොවන සිසු ගුරු නිර්මාණවලට වැඩි අවධානයක් යොමු නොකරන උපකරණ ඇතත් ඒවා භාවිතය සඳහා පෙළඹවීමක් දක්නට නොහැකි විදුහල්පති, ජ්‍යෙෂ්ඨ ගුරුභවතුන් හා බාහිර අධීක්ෂකයින් විසින් පන්ති කාමර ක්‍රියාකාරකම් අධීක්ෂණයට භාජනය නොකෙරෙන ස්ථානයක් ලෙස කොමිසම කළ විමසුම්වලදී අනාවරණය වී ඇත. පද්ධතිය නොසලකා හැර ඇති ස්ථානයක් ලෙස පන්ති කාමරය පිරිහී

ඇති බව පවසයි. මෙවන් වාතාවරණයක් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව සෑහීමකට පත්වීමට හැකියාවක්ද නොලැබෙයි. විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය පන්ති කාමරය, ගුරුවරුන්, සිසුන් මුහුණ පා ඇති තත්වයට විසඳුම් සපයා ගැනීමට භාවිත කළ හැකිය. ශිෂ්‍ය ලැදියා කෙරෙහි දිශානත වූ අධ්‍යාපනය මෙන්ම සිසුන් විශ්ලේෂණය කරා යොමු කිරීම, අධ්‍යාපනයේ නව ප්‍රවණතා ඔස්සේ වර්තමාන අධ්‍යාපන පද්ධතිය මුහුණ දී ඇති තත්වයෙන් මුදා ගැනීමට භාවිත කළ හැකි ය.

අධ්‍යාපනයෙන් අපේක්ෂිත නිපුණතා වන සන්නිවේදනයට අදාළ නිපුණතා, පරිසරයට අදාළ නිපුණතා, ක්‍රීඩාව විවේකයට අදාළ නිපුණතා, ඉගෙනුමට ඉගෙනුම නිපුණතාව, ආගම හා ආචාර ධර්මවලට අදාළ නිපුණතාව, මෙන්ම 2003 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව නිර්දේශ කරන ලද පෞරුෂයට අදාළ නිපුණතා, වැඩ ලෝකයට අදාළ නිපුණතා අත් පත් කර ගැනීමට විශේල්ෂී අධ්‍යාපනය දර්ශනය ඉතාම වැදගත්ය වේ.

අධ්‍යාපනය තුළින් විශ්ලේෂණාත්මකව ගැටලුවලට මුහුණ දීමට අවකාශය සැපයිය යුතුය. මෙවලම්, තාක්ෂණයන් සහ තොරතුරු පද්ධති බහුවිධ සම්බන්ධතා, ඒවායේ සමාජීය සංකේතාත්මක, බහුමාධ්‍ය මැදිහත්වීම් සහ සංස්කෘතික භාවිතයන් සහ ඒවායේ අර්ථ නිරූපණය ගැන සැලකිලිමත් වන එකකි. පවතින සහ නැගී එන ඩිජිටල් නිර්මාණ භාවිතය, දැනුම සහ විචාරය පිළිබඳ අවබෝධය ගොඩනැගීම සඳහා බහු විශ්ලේෂණාත්මක දෘෂ්ටිකෝණයන් ඉතා වැදගත් වේ. මෙම දෘෂ්ටිකෝණයන් සහ ප්‍රවේශයන් නිර්මාණය සඳහා සහ නිර්මාණය මගින් සහයෝගී, සංස්කෘතික, අර්ධ විද්‍යාත්මක, තාක්ෂණික සහ සන්නිවේදන සන්දර්භයන් පිළිබඳ විමර්ශනය කෙරෙහි අවධානය යොමු කරයි (Frayling, 1993). මෙය මෙවලම්, පද්ධති සහ භාවිතය සහ ඒවාට ඇති සම්බන්ධතා සලකා බැලීමට අමතරව, සංස්කෘතික සම්පත් සහ සැලසුම් කිරීමේදී සහ නිර්මාණය කිරීම හරහා මැදිහත් වූ වැදගත්කම මත බර තබයි.

එසේම විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය ප්‍රායෝගිකව පදනම් වූ පර්යේෂණ විශ්ලේෂණාත්මක රාමු නිර්මාණය කිරීමේ සහ පර්යේෂණ කිරීමේ නැගී එන සහ ස්ථාපිත භාවිතයන් සමඟ සම්බන්ධ කරයි.

විශ්ලේෂණාත්මක අධ්‍යාපන දර්ශනයට අධ්‍යාපනික න්‍යායන්, විෂයමාලා සහ ඉගැන්වීමේ ක්‍රමවේද සඳහා තර්කනය, භාෂාමය විශ්ලේෂණය සහ විවේචනාත්මක චින්තනයේ මූලධර්ම අදාළ වේ. විශේෂයෙන් ලුඩ්විග් විට්ගන්ස්ටයින් සහ බර්ට්‍රන්ඩ් රසල් වැනි චින්තකයින්ගේ බලපෑමට ලක් වූ දර්ශනයේ විශ්ලේෂණාත්මක සම්ප්‍රදායේ මුල් බැසගත් මෙම දර්ශනය අධ්‍යාපනික සංකල්ප පැහැදිලි කිරීමට, අපැහැදිලිතා ඉවත් කිරීමට සහ අධ්‍යාපනික කතිකාවේ නිරවද්‍යතාවය සහතික කිරීමට උත්සාහ කරයි. පරමාදර්ශ සහ වටිනාකම් නියම කරන සම්මත අධ්‍යාපනික දර්ශන මෙන් නොව, විශ්ලේෂණාත්මක අධ්‍යාපන දර්ශනය අධ්‍යාපනික භාෂාව විච්ඡේදනය කිරීම, දැනුම හිමිකම්වල වලංගුතාව පරීක්ෂා කිරීම සහ අධ්‍යාපනික ප්‍රතිපත්ති සහ භාවිතයන්හි තාර්කික සහසම්බන්ධතාවය ඇගයීම කෙරෙහි අවධානය යොමු කරයි.

දර්ශනයේ කාර්යභාරය පද්ධති ගොඩනැංවීම නොව අධ්‍යාපනයට අදාළ සංකල්ප විග්‍රහ කිරීමය. සාම්ප්‍රදායික අධ්‍යාපන දර්ශන පද්ධතීන්හි සමහර මූලධර්ම පන්ති කාමර ක්‍රියාවලියට ඍජුවම සම්බන්ධ නොවන බවද දක්නට ලැබේ. නූතන පන්ති කාමර ක්‍රියාවලියේදී ගුරුවරයාට මුහුණ දීමට සිදුවන ගැටලුවලට වැඩි අදාළත්වයක් නොමැති බව හර්ට්ස්ගේ අදහස වී ඇත.

විසි එක්වන සියවසේ තුන්වන දශකය අභිමුවෙහි සිටින ලෝකයට ගැළපෙන පුද්ගලයෙකු තැනීම වර්තමාන අධ්‍යාපනයේ අරමුණු වන අතර ඒ සඳහා ගැළපෙන දර්ශනයක අවශ්‍යතාවය මතුවෙමින් පවතී.

මුවර්, විට්ජින්ස්ටින් වැනි චින්තකයින්ගේ ප්‍රයත්න නිසා විද්‍යාව පිළිබඳ දර්ශනයත්, ගණිතය පිළිබඳ දර්ශනයත් ඥාන විමංසාව සහ අධ්‍යාත්මික විද්‍යාවත් දියුණු විය. ඔවුන්ගේ අධ්‍යයන නිසා අදාළ ක්ෂේත්‍රවල මූලික ලක්ෂණ පැහැදිලි කිරීමට වැදගත් පිටුබලයක් ලැබුණි. සේනාධීර (2018) දක්වන ආකාරයට නූතන පන්ති කාමර ක්‍රියාවලියේදී ගුරුවරයාට මුහුණ දීමට සිදුවන ගැටලුවලට වැඩි අදාළත්වයක් සාම්ප්‍රදායික අධ්‍යාපන දර්ශනයෙන් ලබා ගත නොහැක (Partnership for 21st century Learning, 2019). Framework for 21st century

Learning හි සඳහන් වන ආකාරයට Critical thinking (තාර්කික බුද්ධිය), Creativity (නිර්මාපී බව) Collaboration (සහයෝගීතාව), Communication (සන්නිවේදනය) පිළිබඳ අවධානය යොමු කරයි.

ඒ සඳහා අවශ්‍ය පදනම සැපයීමට විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය භාවිත කළ හැකි ය.

1. සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම ප්‍රවර්ධනය කිරීම

විශ්ලේෂණාත්මක දෘෂ්ටිකෝණ අධ්‍යාපනික භාවිතයන් දැනුම් දීම සඳහා දත්ත සහ ප්‍රායෝගික සාක්ෂි භාවිත කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. මෙම ප්‍රවේශය අධ්‍යාපනඥයන්ට, පරිපාලකයන්ට සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ට බුද්ධිය පදනම් කරගත් තීරණවලින් ඉවත් වී පර්යේෂණ මත පදනම් වූ තීන්දු තීරණ ගැනීමට අවශ්‍ය පසුබිම සකසයි. ප්‍රතිඵල ඇගයීමෙන් පසු නිවැරදි නිගමනවලට එළඹීමට වඩාත් ඵලදායී තීරණ ගැනිමට සිසුන් හුරු කිරීමට මෙම දර්ශනය භාවිත කළ හැකි ය. මෙය අනාගත වෘත්තියකදී, මෙන්ම සිය පෞද්ගලික ජීවිතයේදී කළමනාකරණ ක්‍රියාවලියට අදාළව ක්ෂණික සහ නිවැරදි මෙන්ම සාක්ෂි මත පදනම්ව වූ තීරණ ගැනීමට වැදගත් වේ.

2. විවේචනාත්මක චින්තන කුසලතා වැඩි දියුණු කිරීම

විශ්ලේෂණාත්මක අධ්‍යාපනයේ මූලික ලක්ෂණයක් වන්නේ නූතන ලෝකයේ සිසුන් සඳහා අත්‍යවශ්‍ය කුසලතාවයක් වන විවේචනාත්මක චින්තනය ප්‍රවර්ධනය කිරීමයි. එය විසි එක් වන සියවසේ අධ්‍යාපනයෙන් අපේක්ෂා කරන C4 (Critical thinking, Creativity, Collaboration, Communication) සංකල්පය තුළ ද හඳුනාගත හැකිය. විශ්ලේෂණාත්මක ඉදිරි දර්ශන සිසුන්ගේ විවේචනාත්මකව සිතීමට, තොරතුරු විශ්ලේෂණය කිරීමට සහ ගැටලු විසඳීමට ඇති හැකියාව වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. විශ්ලේෂණාත්මක දෘෂ්ටිකෝණයන් සංකීර්ණ අධ්‍යාපන ගැටලු පුළුල් පරීක්ෂණයක් සඳහා කුඩා සංරචකවලට බිඳ දැමීම ඇතුළත් වේ. ගැටලුවකට දායක වන යටින් පවතින සාධක අවබෝධ කර ගැනීමෙන් අධ්‍යාපනඥයින් ට ඉලක්කගත විසඳුම් සංවර්ධනය කළ හැකිය (මැක්මිලන්, 2007).

3. ඉගැන්වීමේ භාවිතයන් සහ අධ්‍යාපන ප්‍රතිපත්ති දැනුම් දීම සඳහා ආනුභවික දත්ත භාවිතය

විශ්ලේෂණාත්මක අධ්‍යාපනයේ හරය වන්නේ විවේචනාත්මක චින්තනය ප්‍රවර්ධනය කිරීමයි. අධ්‍යාපනඥයින් සිසුන්ට ද්‍රව්‍ය සමඟ ගැඹුරින් සම්බන්ධ වීමට, උපකල්පන ප්‍රශ්න කිරීමට සහ ඔවුන්ගේ ඉගෙනීම පිළිබිඹු කිරීමට දිරිමත් කරයි. මෙම ප්‍රවේශය සිසුන්ට සංකීර්ණ ගැටලු හරහා තාර්කිකව සිතීමට සහ තර්ක කිරීමට උගන්වයි, කටපාඩම් කිරීමෙන් ඔබ්බට ගැඹුරු අවබෝධයක් කරා ගමන් කරයි (පෝල් සහ එල්ඩර්, 2014).

4. විශ්ලේෂණාත්මක දෘෂ්ටිකෝණයන් මගින් පවතින භාවිතයන් ක්‍රමානුකූලව තක්සේරු කිරීම, විකල්ප ගවේෂණය කිරීම සහ තාර්කික විශ්ලේෂණයන් මත පදනම්ව තීරණ ගැනීම මගින් ඵලදායී අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීමට හැකියාව ලැබේ. තිරසාර සංවර්ධන ඉලක්ක අංක හතර යටතේ ලොව පුරා සියලු දරුවන්ට සම අධ්‍යාපන අවස්ථා තහවුරු කළ යුතුය. ලෙවින් උපුටා දක්වමින් ගලගමගේ (2016: 257) දක්වන ආකාරයට අධ්‍යාපනයට ප්‍රවේශ වීමට, නිරත වීමට, ඵල ලැබීමට සමාන අයිතිවාසිකමක් ඇත. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා ශ්‍රව්‍ය, දෘෂ්‍ය, ස්පර්ශ වැනි සංවේදන කිහිපයක් ඔස්සේ වඩා තීව්‍ර ඉගෙනුමක් ඇති කිරීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද කිහිපයක් ඔස්සේ සංකල්ප සාධනය කිරීමට සාම්ප්‍රදායික ක්‍රමවේදවලින් ඔබ්බට ගිය AR,VR වැනි ක්‍රම වේද භාවිත කිරීම මගින් එම සිසුන්ගේ සම අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීම සඳහා ඩිජිටල් සාක්ෂරතාවය හෝ පන්ති කාමරය තුළ තාක්ෂණය ඒකාබද්ධ කිරීම සඳහා වන තල්ලුව විශ්ලේෂණාත්මක ප්‍රවේශයකින් දත්ත මත පදනම් වූ තීක්ෂණ බුද්ධිය මගින් වඩා හොඳින් මෙහෙය විය හැකිය.

5. ක්‍රමානුකූල වැඩිදියුණු කිරීම දිරිමත් කිරීම

විශ්ලේෂණාත්මක අධ්‍යාපනය සංකීර්ණ ගැටලු කළමනාකරණය කළ හැකි සංරචක බවට බිඳ දැමීම සහ ක්‍රමානුකූල විසඳුම් සංවර්ධනය කිරීම මගින් අඛණ්ඩ වැඩිදියුණු කිරීමේ චක්‍රයක් ප්‍රවර්ධනය කරයි. උදාහරණයක් ලෙස, විෂයමාලා සහ ඉගැන්වීමේ ක්‍රම

ශිෂ්‍ය ප්‍රතිඵලවලට බලපාන ආකාරය තක්සේරු කිරීමෙන්, පද්ධතියට ක්‍රමයෙන්, සාක්ෂි මත පදනම් වූ වෙනස්කම් ක්‍රියාත්මක කළ හැකිය. මෙම ව්‍යුහගත ප්‍රවේශය අධ්‍යාපනයේ ගුණාත්මක භාවයේ වඩාත් තිරසාර, දිගුකාලීන වැඩිදියුණු කිරීම්වලට හේතු විය හැක.

6. ගුරු පුහුණුව සහ සංවර්ධනය වැඩිදියුණු කිරීම

ගුරුවරයා සාර්ථක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක තීරණාත්මක සාධකය වේ. විශ්ලේෂණාත්මක දෘෂ්ටිකෝණයන් ගුරු පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය සඳහා දත්ත මත පදනම් වූ ප්‍රවේශයන් සඳහා ඉඩ සලසයි. විශ්ලේෂණාත්මක අධ්‍යාපනය ඉගැන්වීමේ භාවිතයන් සහ අධ්‍යාපන ප්‍රතිපත්ති දැනුම් දීම සඳහා ආනුභවික දත්ත භාවිත කිරීම අවධාරණය කරයි. පර්යේෂණ සොයා ගැනීම්, කාර්ය සාධන දත්ත සහ ක්‍රමානුකූල ඇගයීම් මත රඳා පැවතීමෙන්, ශිෂ්‍ය ඉගෙනීම සඳහා වඩාත් ඵලදායී ක්‍රම සහ උපාය මාර්ග මොනවාද යන්න පිළිබඳව අධ්‍යාපනඥයින්ට වඩාත් දැනුවත් තීරණ ගත හැකිය (ගේජ්, 2009; හැරී, 2009).

7. අනාගත අවශ්‍යතා සමඟ අධ්‍යාපනය පෙළගැස්වීම

වේගයෙන් වෙනස් වන තාක්ෂණයන් සහ පරිණාමය වන රැකියා වෙළඳපොළවල් සහිත ලෝකයක, සාම්ප්‍රදායික අධ්‍යාපනය ලැබූවන් වැඩ ලෝකය තුළ අතරමං වීම වැළැක්වීමට සහ වැඩ ලෝකයට අවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීමට අනාගතය සඳහා සිසුන් සූදානම් කිරීම සඳහා අධ්‍යාපනය ඉක්මනින් අනුවර්තනය විය යුතුය. විශ්ලේෂණාත්මක අධ්‍යාපන දෘෂ්ටිකෝණයන් තාක්ෂණය සහ ගෝලීය අවශ්‍යතා අධ්‍යයනය කිරීමෙන් අනාගත අධ්‍යාපන අවශ්‍යතා පුරෝකථනය කිරීමට උපකාරී වේ. ඩිජිටල් සාක්ෂරතාවය, විවේචනාත්මක චින්තනය, නිර්මාණශීලිත්වය සහ ගැටලු විසඳීම වැනි ශ්‍රම බලකායේ අවශ්‍ය කුසලතා සමඟ පෙළගැස්වූ විෂයමාලා සහ ඉගැන්වීමේ ක්‍රම සැලසුම් කිරීමට ඒවා ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ අධ්‍යාපනඥයින්ට ඉඩ සලසයි.

ස්වයං හඳුනාගත් ඉගෙනීම (Self detected learning) ඉගෙනුම් උපාය මාර්ග යනු ඉගෙන ගන්නන් විසින් ඉගෙනුම්

අරමුණ, උපකරණ සංජානන ඇතුළත් තොරතුරු හෝ කුසලතා අත්පත් කර ගැනීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග සහ ක්‍රියාවලීන් ය. මෙහිදී නියාමන ක්‍රියාවලිය හෝ ප්‍රතිචාර සහ ඉගෙනුම් ප්‍රතිඵල අතර උපායමාර්ගික සම්බන්ධතා පිළිබඳ ඔවුන්ගේ දැනුවත්භාවය සහ අධ්‍යයන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම උපාය මාර්ග භාවිත කිරීම සිදුකෙරේ (සිමර්මන්, 1989). ඔවුන් අධ්‍යාපන කටයුතුවලට විශ්වාසයෙන්, කඩිසරව සහ සම්පත් දායකත්වයෙන් ප්‍රවේශ වෙති. ස්වයං-නියාමනය කරන ලද ඉගෙන ගන්නන් යම් කරුණක් දන්නා විට හෝ කුසලතාවක් ඇති විට නිෂ්ක්‍රීය ඉගෙනුම වෙනුවට ස්වයං මාර්ගෝපදේශ යටතේ තොරතුරු සංස්ලේෂණය, විශ්ලේෂණය, ඇගයීමට ලක් කරයි.

**විනිවිදභාවය සහ නියැලීමට පහසුකම් සැලසීම**

අධ්‍යාපන ප්‍රතිපත්ති සඳහා පැහැදිලි, තාර්කික සහ සාක්ෂි මත පදනම් වූ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීමෙන්, විශ්ලේෂණාත්මක ඉදිරි දර්ශන තීරණ ගැනීමේදී වැඩි විනිවිදභාවයක් ඇති කරයි. මෙම විනිවිදභාවය දෙමාපියන්, ශිෂ්‍යයා වැනි කොටස්කරුවන් සමඟ විශ්වාසය ගොඩනගයි (Chunk, 2012). ශිෂ්‍ය ප්‍රගතිය, ගුරු කාර්යක්ෂමතාව සහ අධ්‍යාපන ප්‍රතිපත්ති සාර්ථකත්වය සඳහා පැහැදිලි මිනුම් දණ්ඩක් ලබා දීමෙන් දත්ත මත පදනම් වූ උපාය මාර්ග වගවීම වැඩි කරන ආකාරය සාකච්ඡා කරයි.

**විශ්ලේෂී අධ්‍යාපන දර්ශනය වර්තමාන අධ්‍යාපන පද්ධතිය තුළ භාවිත වන අවස්ථා**

අධ්‍යාපන පරමාර්ථ සකස් කිරීමට පදනම සපයයි.

පීටර්ස් සඳහන් කරන ආකාරයට අධ්‍යාපන පරමාර්ථ අවසාන නිෂ්පාදනය නොවේ. එසේම වෛද්‍ය විද්‍යාවේදී මෙන් අධ්‍යාපනයේදී අවසන් නිෂ්පාදනයක් තිබිය යුතුය. පීටර්ස්ට අනුව උසස් චරිතයක් සහ පුළුල් බුද්ධියක් ඇති කිරීමේ අරමුණින් තාක්ෂණික හෝ වෘත්තීය නම්‍යතාවයකින් යුක්තව ලබා දිය යුතුයි. ඒ අනුව අධ්‍යාපනයේ වටිනාකම පිළිබඳ විවිධ වූ එකිනෙකට වෙනස් වූ ඇගයීම් සිදු කිරීම වර්තමාන අධ්‍යාපන පද්ධතිය තුළ පවා අවධාරණය කෙරේ.

පීටර්ස්ට අනුව අධ්‍යාපනයේ පරමාර්ථය මෙසේ දැක්විය හැක.

1. ආත්ම සාක්ෂාත්කරණය
2. චරිත වර්ධනය
3. බුද්ධිය වර්ධනය
4. පුරවැසි භාවය
5. සමාජීය අපේක්ෂණ ඉටුකිරීම
6. අවසාන නිෂ්පාදනයක අවශ්‍යතාව
7. තාක්ෂණික නම්‍යතාව
8. වෘත්තීය නම්‍යතාව

මෙරට අධ්‍යාපනයෙන් පොදු ජාතික අරමුණු අටක් ඉදිරිපත් කර ඇති අතර මූලික නිපුණතා හතකි. එම මූලික නිපුණතා ඉහත පීටර්ස් හඳුන්වා දී ඇති පරමාර්ථ ඉටුකරගැනීම කෙරෙහි දිශානත වී ඇති බව හඳුනාගත හැකිය.

ඊශ්‍රායෙල් ෂෙප්ලර් දාර්ශනික සංකල්ප අධ්‍යාපනයට ආදේශ කිරීමේදී විවිධ ප්‍රායෝගික දුෂ්කරතාවලට මුහුණ දෙන බව පවසයි. විවිධ දාර්ශනිකයන් අධ්‍යාපන අරමුණු හා අධ්‍යාපන ප්‍රතිසංවිධානයන් යෝජනා කරන්නේ ඔවුන්ගේ විශ්වාසයන්, තර්කයන්, උපකල්පනයන්, හා විනිශ්චයන් පදනම් කරගෙන ය (Sheffler, 1995). එසේම මොහු ඉගැන්වීමේ ආකෘති තුනක් හඳුන්වා දී ඇත.

1. හැඟීම් කේන්ද්‍රීය ආකෘතිය
2. ප්‍රතිවේද ආකෘතිය
3. නීති ආකෘතිය

**1. හැඟීම් කේන්ද්‍රීය ආකෘතිය**

මොහුට අනුව දරුවකු උපතින් හැඟීම්වලින් තොර මනසකින් උපදින අතර ඔහු ලබන අත්දැකීම් තුළින් බාහිර ලෝකය පිළිබඳ හැඟීම් ඔහු තුළ ක්‍රම ක්‍රමයෙන් තහවුරු වේ. ඉගැනවීමෙන් බලාපොරොත්තු වන්නේ ශිෂ්‍යයන්ට තමන් වෙත ගලා එන අදහස්

සංජානනය කර මතකයෙහි තැන්පත් කර ගැනීමේ ක්‍රියාවලියට දිරි ගැන්වීමයි. ඉගැන්වීම තුළින් ශිෂ්‍යයා වෙත ඉදිරිපත් කරන කරුණු ක්‍රමානුකූලව තෝරා ගෙන සංවිධානය කර ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. ගුරුවරයාට තමා සතුව ඇති ශක්තීන් උපයෝගී කරගෙන ශිෂ්‍යයාගේ සිත බොහෝ දුරට සකස් කිරීමේ හැකියාව ඇත (Chan, 1965).

**2. ප්‍රතිවේද ආකෘතිය**

පළමු ආකෘතියෙන් අපගමනය වී ඇති ආකෘතියකි. පළමු ආකෘතිය මගින් ගුරුවරයා දැනුම් කොටස් ටිකෙන් ටික ලබා ගැනීමට ශිෂ්‍යයාට පහසුකම් සලසන අතර දැනුම දැක්මක් ලෙස සලකතොත් එම කුඩා කොටස් වශයෙන් ශිෂ්‍යයකු වෙත ආරෝපණය කිරීම දුෂ්කරය. එසේ වුවද ගුරුවරයා ශිෂ්‍යයාට ඉදිරිපත් කරන ප්‍රබෝධක තුළින් ශිෂ්‍යයා තුළ මෙම දැනුම තහවුරු වීමක් අපේක්ෂා කෙරේ (Chan, 1965).

**3. නීති ආකෘතිය**

හේතුන්ට මුල් තැන දෙන දාර්ශනික මතවාදයකි. මෙම ආකෘතිය අනුව මූලධර්ම හේතු සහ ඒකාග්‍රතාව, අනුරූපත්වය යන සංකල්ප බොහෝ දුරට එකිනෙකට අනුරූපව ක්‍රියාත්මක වේ. දැනුම සහ චරිතය පිළිබඳ සදාචාර ඇගයීම්, ඉහත සංකල්පවලට අනුරූපව නිර්ණය කෙරේ (Chan, 1965).

හේතුව සහ ඵලය අතර සම්බන්ධයක් අනාවරණය වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වා ගෙන යාමට එනම් ගණිතය, විද්‍යාව, තාක්ෂණවේදය වැනි විෂයන්ට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමට, සංවිධානය කිරීමට, පවත්වා ගෙන යාමට සහ පාලනය සඳහා නීති ආකෘතිය ඉතා වැදගත් වේ.

ප්‍රතිවේද ආකෘතිය තුළ ප්‍රබෝධක ප්‍රතිචාර බන්ධනය තහවුරු කිරීම මගින් ගුරුවරයාගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වා ගෙන යාමට වර්තමානයේ දී ගුරු අධ්‍යාපන පාඨමාලාවලදී පවා අවධාරණය කරයි. එසේම ශිෂ්‍යයා නව නිර්මාණකරණය වෙතට යොමු කිරීම මගින් වැඩ ලෝකය හා සංගත වූ ශ්‍රමිකයකු,

කුසලතා පූර්ණ පුරවැසියකු බිහි කිරීමට භාවිත කිරීම පළමු ප්‍රධාන අවධියේ සිටම හඳුනා ගත හැකිය. පළමු ප්‍රධාන අවධියේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රධාන ක්‍රමවේද තුනක් ඔස්සේ ක්‍රියාත්මක වේ. එනම් සැළසුම් සහගත සෙල්ලම්, ක්‍රියාකාරකම් සහ අසුන්ගත වැඩ වේ. වැඩලෝකයට අදාළ නිපුණතා ශිෂ්‍යයාට අත්පත් කර දීම අධ්‍යාපනයෙන් අපේක්ෂා කරන මූලික නිපුණතාවකි.

වර්තමානය වන විටත් මෙරට විධිමත්, අවිධිමත්, නොවිධිමත් විෂයමාලාවට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වා ගෙන යාමේදී මෙන්ම ගුරු අධ්‍යාපන පාඨමාලාවලදී විශ්ලේෂී අධ්‍යාපන දර්ශනයේ ආභාෂය හඳුනා ගත හැකිය.

හැඟීම් කේන්ද්‍රීය ආකෘතිය අදහස් කොටස් වශයෙන් සංජානනය කිරීම වර්තමාන අධ්‍යාපන පද්ධතිය තුළ හඳුනා ගත හැකිය. එහිදී සංකල්ප වන සිරස් සමෝධානය සහ තිරස් සමෝධානය ඔස්සේ සංකල්ප කොටස් වශයෙන් සංජානනය සහ ගුරුවරයාගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සරල සංකල්පයේ සිට සංකීර්ණ සංකල්ප දක්වා විකාශනය වන ආකාරයට එනම් දන්නා සංකල්පයේ සිට නොදන්නා සංකල්පය දක්වා විකාශනය වන ආකාරය සකස් කර ගැනීම සිදු කෙරෙයි. ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරකයක් ලෙස සහ ඇගයීම් උපකරණයක් ලෙස භාවිත කළ හැකි සංකල්ප සිතියම්, මනස් සිතියම් ඔස්සේ මෙම සංකල්ප අතර සම්බන්ධතාවයක් අනාවරණය වන ආකාරයට, සංකල්ප කොටස් වශයෙන් සංජානනය වන ආකාරයට, මෙන්ම හේතු ඵල අතර සම්බන්ධය අනාවරණය වන ආකාරයට භාවිත කිරීමට පූර්ව සේවා ගුරු අධ්‍යාපන පාඨමාලාවලදී මෙන්ම සේවාස්ථ ගුරු අධ්‍යාපන පාඨමාලාවලදී සිදු කෙරේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අබේපාල, ආර්. *අධ්‍යාපන දර්ශනයේ පෙරදිග චින්තන පැතිකඩ*. කොට්ටාවඃ සාර ප්‍රකාශකයෝ.

ගලගමගේ, එස්. (2016) *අධ්‍යාපන සමාජවිද්‍යා මූලධර්ම*. නාවින්නඃ තරංජි ප්‍රින්ටර්ස්.

*ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය* (2018) මහරගමඃ ජාතික අධ්‍යාපන ආයතනය.

කීර්තිරත්න, ඩබ්ලිව්. (2021). *අධ්‍යාපන දර්ශනය*. පාදුක්කඃ සන්දේශා ප්‍රකාශකයෝ.

ලේකම්, ඩී. (2011) *වාර්ෂික ශාස්ත්‍රීය ලිපි සරණිය*. කලාපය 2. නාවල: ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

*ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව* (1992). කොළඹ: අධ්‍යාපන කොමිෂන් සභාව.

සේනාධීර, එස්. සහ වනසිංහ, එස්. (2002). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සැලසුම්කරණය සඳහා දාර්ශනික මාර්ගෝපදේශ*. මරදාන: ගොඩගේ ප්‍රකාශකයෝ.

සේනාධීර, එස්. හේවාපතිරණ, සී. (2002). *ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථත්වය සඳහා ගුරු නිපුණතා*. මරදාන: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවාර්තාව* (1992). කොළඹ: අධ්‍යාපන කොමිෂන් සභාව.

Aristotle. (n.d.). *Metaphysics* (Book II). (Original work published ca. 4th century BCE)

Ayer, A. J. (1936). *Language, Truth and Logic*. London: Gollancz.

Dewey, J. (1916). *Democracy and Education: An Introduction to the Philosophy of Education*. New York: Macmillan.

Gage, N. L. (2009). The Paradigm Wars and Their Aftermath: A "Historical" Sketch of Research on Teaching since 1989. *Educational Researcher*, 38(7), 500–506.

Hattie, J. (2009). *Visible Learning: A Synthesis of Over 800 Meta-Analyses Relating to Achievement*. Routledge. ISSN: 0046-1520 (Print) 1532-6985 (Online). Journal homepage: http://www.tandfonline.com/loi/hedp20

Kant, I. (1781). *Critique of Pure Reason*. Riga: Johann Friedrich Hartknoch.

McMillan, J. H. (2007). *Educational Research: Fundamentals for the Consumer* (5th ed.). Pearson.

Ozmon, H. A., & Craver, S. M. (2008). *Philosophical Foundations of Education* (8th ed.). Upper Saddle River, NJ: Pearson/Merrill Prentice Hall.

Paul, R., & Elder, L. (2014). *Critical Thinking: Tools for Taking Charge of Your Learning and Your Life*. Pearson Education.

Schunk, D. H. (2012). *Learning Theories: An Educational Perspective* (6th ed.). Pearson.

Scheffler, I. (1995). The concept of the educated person. In V. A. Howard & I. Scheffler (Eds.), *Work, Education, and Leadership: Essays in the Philosophy of Education*. New York: Peter Lang.